# පානදුර
# ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය

ආරම්භය 1922

ශත සංවත්සර මහ සභාව

2022 ජූනි මස 25 වන සෙනසුරාදා දින
පෙරවරු 8.30 ට
විද්‍යාලයීය සෝමතිලක විතාරණ ශාලාවේ දී

රාත්‍රී සුහද හමුව සහ භෝජන සංග්‍රහය
පස්වරු 7.00 ට
පානදුර JIE JIE Beach හෝටලයේ දී

**ගෞරවණීය ආරධිත අමුත්තන්**
කොරියන් ස්පා සමූහ ව්‍යාපාරයේ අධිපති,
කීර්තිමත් ආදි ශිෂ්‍ය අනුරත් අබේරත්න මැතිතුමා,
සී.ඩී.ඩී.ඊ.එෆ් සමූහ ව්‍යාපාරයේ අධිපති, කීර්තිමත් ආදි ශිෂ්‍ය
රොහාන්තා ද ෆොන්සේකා මැතිතුමා
නැවුරබ් සමූහ ව්‍යාපාරයේ අධිපති, කීර්තිමත් ආදි ශිෂ්‍ය තිස්ස ඉලේපෙරුම මැතිතුමා

**උපහාරලාභී ආරාධිත අමුත්තන්**
ආදි ශිෂ්‍ය සංගමයේ උපදේශක, විශ්‍රාමික විදුහල්පති විල්සන් කහඳගමගේ මැතිතුමා
වරලත් ඉංජිනේරු, ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ගරු සභාපති විජිත් සල්ගාදු මහතා
ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ගරු සභාපති සනත් ද සිල්වා මැතිතුමා
ආදි ශිෂ්‍ය සංගමයේ හිටපු ගරු සමලේකම් සරත් අල්විස් මැතිතුමා

# වාර්ෂික මහ සභාව

ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ ශත සංවත්සර මහ සභාව 2022 ජූනි මස 25 වන සෙනසුරාදා දින පෙ.ව. 8.30 ට විද්‍යාලයීය සෝමතිලක විතාරණ ශාලාවේ දී පැවැත්වෙන අතර, සුමඟුල් මවට ආදරය කරන සුජාත සුමඟුල් පුතකු වන ඔබට ඒ සඳහා ගෞරවයෙන් ආරාධනා කර සිටිමු.

## න්‍යාය පත්‍රය

පෙ.ව. 8.30 ජාතික, බෞද්ධ, පාසල් ධජ ස්ථම්භගත කිරීම.

පෙ.ව. 8.35 ජාතික ගීය වාදනය.

පෙ.ව. 8.45 ප්‍රධාන ශාලාවට පිවිසීම.

පෙ.ව. 8.50 පන්සිල් සමාදන් වීම සහ පැවිදි අනුශාසනාව.

පෙ.ව. 9.00 පාසල් ගීතය වාදනය කිරීම.

පෙ.ව. 9.05 අභාවප්‍රාප්ත ආදි කතෘ වරුන්, ගුරුවරුන්, ආදි සිසුන් හා රණවිරුවන් සිහි කිරීම.

පෙ.ව. 9.06 පිළිගැනීමේ කතාව.

පෙ.ව. 9.15 ගරු විදුහල්පතිතුමාගේ කතාව.

පෙ.ව. 9.30 ශාඛා සංගම්හි සභාපතිවරුන්ගේ කතා.

පෙ.ව. 9.45 කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමයේ ගරු සභාපතිතුමාගේ කතාව.

පෙ.ව. 9.50 ලැබුණු ලිපි කියවීම.

පෙ.ව. 10.00 2021 සංවත්සර මහ සභා වාර්තාව සභාගත කිරීම සහ සම්මත කර ගැනීම.

පෙ.ව. 10.15 2021 අයවැය වාර්තාව සභාගත කිරීම සහ සම්මත කර ගැනීම.

පෙ.ව. 10.30 යෝජිත ව්‍යවස්ථා සංශෝධනය සභා සම්මත කර ගැනීම.

පෙ.ව. 10.45 අදහස් සහ යෝජනා.

ප.ව. 12.00 නිල කාලය අවසානයේ සමලේකම්තුමාගේ ස්තුති කතාව.

ප.ව. 12.10 වැඩ බලන සභාපතිවරයෙකු පත්කර ගැනීම.

ප.ව. 12.15 2022/2023 වසර සඳහා නව නිලධාරී මණ්ඩලය පත්කර ගැනීම.

ප.ව. 12.30 ගරු ගිණුම් පරීක්ෂකවරයෙකු පත්කර ගැනීම.

ප.ව. 12.35 ගරු සමලේකම්තුමාගේ ස්තුති කතාව.

ප.ව. 12.45 රැස්වීමේ නිමාව සහ සභාව විසිර යාම.

# රාත්‍රී සුහද හමුවේ න්‍යාය පත්‍රය

| | |
|---|---|
| ප.ව. 7.00 | ආරාධිත අමුත්තන් පිළිගැනීම සහ ශාලාවට කැඳවාගෙන ඒම. |
| ප.ව. 7.05 | පොල්තෙල් පහන දැල්වීම |
| ප.ව. 7.10 | අභාවප්‍රාප්ත ආදි කතෘ වරුන්, ගුරුවරුන්, ආදි සිසුන් හා රණවිරුවන් සිහි කිරීම. |
| ප.ව. 7.11 | ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව. |
| ප.ව. 7.20 | ගරු විදුහල්පතිතුමාගේ කතාව. |
| ප.ව. 7.30 | ගෞරවණීය ආරාධිත අමුත්තන් හඳුන්වා දීම සහ උපහාර තිළිණ ප්‍රදානය. |
| ප.ව. 7.45 | උපහාරලාභි ආරාධිත අමුත්තන් හඳුන්වා දීම සහ තිළිණ ප්‍රදානය. |
| ප.ව. 7.55 | සමලේකම්තුමාගේ ස්තුති කතාව. |

## 2021/2022 නිලධාරී මණ්ඩලය

| | | |
|---|---|---|
| ගරු පැවිදි අනුශාසක | - | මහාචාර්යය පූජ්‍ය කහපොල සුගතරතන නායක මාහිමිපාණන්. |
| ගරු අනුශාසකවරු | - | ගරු විදුහල්පති නිලූක වීරසිංහ මහතා.<br>මහාචාර්යය කපිල පෙරේරා මහතා.<br>පෙර සිංහාධිපති රොහාන්තා ද ෆොන්සේකා මහතා.<br>සරත් අල්විස් මහතා.<br>වරලත් ඉංජිනේරු තිලක් ද සිල්වා මහතා.<br>පානදුර නගරාධිපති නන්දන ගුණතිලක මහතා. |
| ගරු උපදේශකවරු | - | විශ්‍රාමික විදුහල්පති විල්සන් කහඳගමගේ මහතා.<br>වරලත් ඉංජිනේරු විජිත් සල්ගාදු මහතා.<br>සනත් ද සිල්වා මහතා.<br>අනුරත් අබේරත්න මහතා.<br>අරවින්ද පෙරේරා මහතා. |
| ගරු සභාපති | - | මහේෂ් ෆොන්සේකා මහතා. |
| ගරු සමලේකම්වරු | - | අමිල නාවලගේ මහතා.<br>ධනුක කොට්ටහච්චි මහතා. |
| ගරු භාණ්ඩාගාරික | - | දිනේෂ් කැටිපෙආරච්චි මහතා. |
| ගරු උප සභාපතිවරු | - | නිමේෂ නාවලගේ මහතා.<br>කුමාරසිරි බෝදරගමගේ මහතා.<br>පද්මාල් ගුණරත්න මහතා.<br>නුවන් රණමයුර මහතා.<br>මධුසංක නාමසේන මහතා.<br>චමත් ඩයස් මහතා.<br>කසුන් හේවගේ මහතා.<br>චාමර පීරිස් මහතා.<br>දුෂාන්ත චානක පෙරේරා මහතා.<br>දිලීක මදුරංග මහතා.<br>සුමේධ වී. පෙරේරා මහතා. |
| ගරු උප භාණ්ඩාගාරික | - | ප්‍රභාත් තාරක මහතා. |
| ගරු නීති උපදේශක | - | නීතිඥ සුදේශ් චතුර මහතා. |
| ගරු සංස්කාරක | - | විශ්ව ජයතුංග මහතා. |
| ගරු සමාජ කටයුතු ලේකම් | - | චන්න ධම්මික මහතා. |

ගරු කාරක සභිකවරුන් -

1. ජනක සුදාරක මහතා
2. දිනේෂ් අබේපාල මහතා
3. මංජුල විජේවර්ධන මහතා
4. ධනුෂ්ක සංජය මහතා
5. අමරලංකා ප්‍රනාන්දු මහතා
6. රජීව් ප්‍රනාන්දු මහතා
7. බන්දු ලක්සිරි මහතා
8. නිලුක ඉරෝෂන ප්‍රනාන්දු මහතා
9. නිශාන්ත සෙනෙවිරත්න මහතා
10. ඉන්දික විජේනායක මහතා
11. යසිත සමන්ත ප්‍රනාන්දු මහතා
12. භාෂිත වීරතුංග මහතා
13. නෆ්ලි නසීර් මහතා
14. නීල් සුනෙත්‍රලාල් මහතා
15. ජගත් වංශපාල මහතා
16. සමීර ගුණතිලක මහතා
17. ජනක චිත්‍රානන්ද මහතා
18. ගයාන් ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
19. මධුර ප්‍රනාන්දු මහතා
20. මනෝජ් ප්‍රසන්න පීරිස් මහතා
21. ශිරාන් සේනානායක මහතා
22. දිනේෂ් සිල්වා මහතා
23. කසුන් හිරන්ත ජයතිස්ස මහතා
24. රමිල ආසිරි පෙරේරා මහතා
25. චන්දන සම්පත් විතාරණ මහතා
26. සුරංග මංජුල මහතා
27. සුරේෂ් ඉෂාන් ප්‍රනාන්දු මහතා
28. පසන් මදුක පරේරා මහතා
29. සංජීව ලක්රුවන් ප්‍රනාන්දු මහතා
30. රොෂාන් සෙද්නාරත්න මහතා
31. මදුර පෙරේරා මහතා
32. රුවන් චාමර මහතා
33. අරුණ පෙරේරා මහතා
34. චරිත ගුණතිලක මහතා
35. ගයාන් විජේසුන්දර මහතා
36. කපිල කුමාර මහතා
37. මධුෂාන් අසංක මහතා
38. මොහාන් සමීර සිල්වා මහතා
39. කේ මනෝජ් පීරිස් මහතා
40. නදුන් දර්ශන ජයසේකර මහතා
41. චානක මීගොඩ මහතා
42. ලිෂාන් අමරසේකර මහතා

කනිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය නියෝජනය කරන සාමාජිකයින්

1. ගීත් සංජය
2. මලිත් සිල්වා

3. මාලිංග ලක්ෂාන්
4. සචින් සහන්ජය
5. චන්දිම වරුණ
6. ශෂිත මධුෂාන්
7. ප්‍රියන් ද සිල්වා

## සංවත්සර වාර්තාව

2021 දෙසැම්බර් මස 26 වන ඉරු දින පෙ.ව. 8.30 ට ශ්‍රී සුමංගල විද්‍යාලයීය සෝමතිලක විතාරණ ශාලාවේ දී පවත්වන ලද 99 වෙනි සංවත්සර මහ සභාව විසින් තෝරා පත්කර ගන්නා ලද නිලධාරී මණ්ඩලය විසින් 2021/2022 වර්ෂය සඳහා වූ ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමයේ විධායක සභාවේ කාර්යයන් ඉෂ්ඨ කිරීම සිදුකරන ලදි.

අප සංගමයේ ව්‍යවස්ථාවට අනුව සංගමයේ මුදල් වර්ෂය සෑම වසරකම දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන අතර, එතැන් සිට මාස හයක් තුළ මහසභා රැස්වීම පැවැත්විය යුතුව ඇත. කෙසේවුව ද පසුගිය වසරේ අනපේක්ෂිත ලෙස ලොවම වෙළාගත් කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සමාජ ඒකාරාශී වීම් රජය විසින් තහනම් කරනු ලැබූ අතර, ඒ අනුව අප සංගමයට ද මහසභා රැස්වීම් පැවැත්වීම් කල්දැමීමට සිදුවිය.

එසේවුව ද රටේ තත්ත්වය යම් අතකට යහපත් අතට හැරීමෙන් පසුව අප විසින් 2021 දෙසැම්බර් මස 26 වන දින 99 වෙනි මහසභා රැස්වීම පවත්වන ලදි. එම මහසභා රැස්වීමේ දී තෝරා පත්කර ගනු ලැබූ සභාපතිවරයෙකුගෙන් සමන්විත වූ විධායක සභාවක් මගින් පසුගිය මාස හයක කාල සීමාව තුළ විද්‍යාලයේ දියුණුව වෙනුවෙන් නිබඳව කටයුතු කරන ලදි.

ඒ අනුව සංගමයේ පසුගිය විධායක සභාවේ කාලය **<u>මාස හයකට පමණක් සීමා වූ අතර</u>**, එම කාල සීමාව තුළ අප සංගමය විසින් සිදුකරනු ලැබූ කාර්යයන් සහ කර්තව්‍යයන් සංක්ෂිප්තව පහත දක්වා සිටිමු.

### 1. "සුමඟුල් රිවිබල" විදුලි උත්පාදන ව්‍යාපාතිය

පසුගිය මාස හයක කාල සීමාව තුළ අප විසින් සිදුකරනු ලැබූ වැදගත්ම ව්‍යාපෘතිය ලෙස මෙම "සුමඟුල් රිවිබල" විදුලි උත්පාදන ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය.

මුළු ලෝකයම බලශක්ති අර්බුධයකට මුහුණ දී සිටින යුගයක අප සංගමයේ සියවස් සමරු වැඩසටහන් මාලාවේ එක් පියවරක් ලෙස මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සිදුකරන ලදි. එහි පළමු අදියර සාර්ථකව නිමකර 2022 මැයි මස 05 වන දින නිල වශයෙන් පාසලට ලබාදීමට අප සංගමයට හැකිවිය.

මෙම ව්‍යාපෘතිය මගින් පාසලේ විදුලි පරිභෝජනය වෙනුවෙන් දැරීමට සිදුවන විශාල මුදලක් ඉතිරිකර දීම අපගේ අරමුණයි.

මෙම ව්‍යාපෘතිය සාර්ථකත්වය කරා ගෙනයාමට සංගමය වෙනුවෙන් සම්බන්ධීකරණය කළ ගරු උප සභාපති චමත් ඩයස් මහතා ප්‍රමුඛ කමිටු සාමාජිකයින් වන උප සභාපති දිලීක මධුරංග, සමීර ගුණතිලක යන මහත්වරුන්ට සංගමයේ විශේෂ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමු.

එසේම මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගනු වස් අවශ්‍ය මූල්‍ය උත්පාදන ක්‍රියාවලියෙහි ලා සුවිශේෂී කාර්යභාරයක් ඉටුකළ සංගමයේ ගරු භාණ්ඩාගාරික දිනේෂ් කැටිපේආරච්චි මහතාටත් සංගමයේ ස්තුතිය මෙහිලා පිරිනමා සිටින්නෙමු.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට සහාය දැක්වූ ගරු උප සභාපතිවරුන් වන නිමේෂ නාවලගේ සහ නුවන් රණමයුර යන මහත්වරුන්ටත් සංගමයේ ස්තුතිය මෙහිලා පිරිනමා සිටින්නෙමු.

මෙම ව්‍යාපෘතිය සඳහා වැඩිම පුද්ගලික ධන පරිත්‍යාගය වන රුපියල් ලක්ෂ පහ
(රු. 500,000/=) ක මුදලක් සංගමයේ ගරු උප සභාපති කපිතාන් කසුන් හේවගේ මහතා විසින් පරිත්‍යාග කරන ලද අතර, ඒ මහතාට සංගමයේ විශේෂ ස්තූතිය පිරිනමා සිටී.

සංගමයේ වර්තමාන විධායක කමිටුව නියෝජනය නොකරන නමුත්, සංගමයේ සාමාජිකයින් වන කැළුම් රත්නවීර, යෙහෙන් ශමිත් අතුකෝරළ සහ අකේෂ් දෙහෙරගොඩ යන මහත්වරුන් මූල්‍ය උත්පාදනයේ දී දැක්වූ සහයෝගයට සංගමයේ ස්තුතිය පිරිනමා සිටී.

සංගමයේ ඉල්ලීම පරිදි මේ සඳහා මූල්‍ය දායකත්වය ලබා දෙමින් සහාය දැක්වූ ඩුබායි ශාඛාවේ ගරු සභාපති නන්දික ඒකනායක මහතා ප්‍රමුඛ එම ශාඛාවේ සියලු සාමාජිකයින්ට අප සංගමයේ ස්තුතිය පුදකර සිටිමු.

ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික තාක්ෂණික දැනුම ලබාදුන් ආදි සිසු පරිගණක ඉංජිනේරු තිවංක විමලසූරිය මහතාටත්, ව්‍යාපෘතිය ආරම්භයෙන් පසු තාක්ෂණික සහයෙන් අප සංගමයට නිරතුරු ශක්තියක් වූ සුමංගල 96 කණ්ඩායමේ ඉංජිනේරු ප්‍රදීප් සංජීව ගමගේ මහතාට ද සංගමයේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමු.

ව්‍යාපෘතිය සඳහා ලිපිලේඛන සැකසීමේ දී සහාය දැක්වූ උප සභාපති නිමේෂ නාවලගේ මහතාට ද, ව්‍යාපෘති වාර්තාව සැකසීමේ දී සහ අන්තර්ජාල ප්‍රචාරක කටයුතු සිදුකළ උප සභාපති චාමර පීරිස් මහතාට ද ස්තුතිය පිරිනමා සිටිමු.

මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුශාසනා ලබාදෙමින් අපට නිරතුරුව ශක්තියක් වූ සංගමයේ ගරු උපදේශක විජිත් සල්ගාදු මහතාට ද සංගමයේ ගෞරවණීය ස්තුතිය පිරිනමා සිටිමු.

අදාල ව්‍යාපෘතියේ දී සේවා සැපයුම්කරු වූ SOLITRA POWER (PVT) LTD ආයතනය සහ අප සංගමය අතර නීත්‍යනුකූල ගිවිසුමක් සකස් කරමින් එය ලියා අත්සන් කළ ආදි ශිෂ්‍ය නීතිඥ නුවන් ගමගේ මහතාට ද විශේෂ ස්තුතිය පිරිනමා සිටිමු.

මෙම සියලු කටයුතුවල දී අදාල ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම සඳහා නිබඳ ශක්තියක් වූ ගරු සභාපති මහේෂ් ෆොන්සේකා මහතා ප්‍රමුඛ ප්‍රධාන මේසයේ නිලධාරීන් හට විශේෂ ස්තුතියක් හිමිවිය යුතුය.
මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් පරිත්‍යාග කළ පරිත්‍යාගශීලීන්ගේ නාම ලේඛනය අයවැය වාර්තාව සමග ඉදිරිපත් කර ඇත.

## 2. වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය

විදුහලේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 දෙසැම්බර් මස 22 දින උත්කර්ෂවත් අන්දමින් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පවත්වන ලදි.

මෙම ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ත්‍යාග හිමි දරුවන්ට වවුචර්පත් සහ කුසලාන අප සංගමය විසින් ලබාදෙන ලදි. ඒ සඳහා වැය වූ මුදල රුපියල් දෙලක්ෂ අසූහත්දහස් අටසියය (රු. 287,800/=) කි.

තවද, අ.පො.ස. උසස් පෙළ විෂය ධාරාවන් හතර යටතේ විභාගයට ඉදිරිපත්ව එක් එක් විෂය ධාරාව යටතේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර සරසවි ප්‍රවේශය ලැබූ සිසුන් හතර දෙනාට සහ සරසවි ප්‍රවේශය ලැබූ තවත් ආබාධිත සිසුවෙකුට රුපියල් විසිපන් දහස (රු. 25,000/=) ක් වටිනා තිළිණ ප්‍රදානය කිරීම සිදු කරන ලදි.

## 3. ආදි කතා දිනය

ආදි කතෘ දිනය සමරමින් වාර්ෂිකව විද්‍යාලය සංවිධාන කරන සාංඝික දානමය පුණ්‍යකර්මය සඳහා රුපියල් හැත්තෑ පන් දහස (රු. 75,000/=) ක් පමණ වටිනා පිරිකර අප සංගමය විසින් පරිත්‍යාග කර ඇත.

## 4. අධ්‍යයන කාර්යය මණ්ඩල දීමනා

විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අප සංගමය විසින් රුපියල් එක්ලක්ෂ හැත්තෑදහසක (රු. 170,000/=) ක පමණ මුදලක් අධ්‍යයන කාර්යය මණ්ඩලය වෙනුවෙන් මෙම කාලය තුළ වැයකර ඇත.

## 5. රගර් ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතිය

ශීඝ්‍රයෙන් දියුණුව කරා පියනගන පාසල් රගර් කණ්ඩායමේ උන්නතිය වෙනුවෙන් නිරන්තරයෙන් කැපවන අප සංගමය ඒ සඳහා රගර් පුහුණුකරුට අවශ්‍ය මාසික දීමනාව ක්‍රීඩා උපකරණ ලබාදෙමින් දායකත්වය සපයන ලදි. රගර් පුහුණුකරුට මෙම මාස හයක කාලය තුළ සංගමය මගින් රුපියල් හැටදහස (රු. 60,000/=) ක මුදලක් ගෙවා ඇත.

රුපියල් එකොළොස්දහස අටසිය පනහ (රු. 11,850/=) ක් වටිනා රගර් පන්දු ද අප සංගමය විසින් පරිත්‍යාග කර ඇත.

## 6. ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය උදෙසා සංගමයේ මෙහෙවර

විද්‍යාලයේ ක්‍රිකට් ක්‍රීඩාවේ සංවර්ධනය උදෙසා මෙවර ද අප සංගමය ආදි ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ සංගමය සමග ඉතා සුහදශීලිව සහ සහයෝගයෙන් කටයුතු කරන ලදි. අප පාසලේ ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ක්‍රිකට් පුහුණුකරු දීමනාව වශයෙන් පසුගිය මාස හයක කාල සීමාව තුළ පසුගිය කාලවල දී මෙන්ම මසකට රුපියල් විසිදහස (රු. 20,000/=) බැගින් රුපියල් එක් ලක්‍ෂ විසි දහස (රු. 120,000/=) ක් අප සංගමය වැය කරන ලදි.

## 7. සාමාජිකත්ව ප්‍රවර්ධනය

මෙම මාස හයක කාලය තුළ නව සාමාජිකයින් විසිදෙනෙකු සාමාජිකත්වය ලබා ඇති අතර, ඔවුන් සංගමයට බඳවා ගනිමින් සංගමයේ සාමාජික පදනම වර්ධනය කිරීම සඳහා දායකත්වය දැක්වූ සියලු විධායක සභිකයින්ට ගෞරවනීය ස්තුතිය පළකර සිටිමු.

## 8. විදුහල්පති නිල කාමරය අළුත්වැඩියා කිරීම

සංගමයේ ශත සංවත්සර වැඩපිළිවෙළෙහි තවත් එක් කාර්යයක් ලෙස පාසලේ විදුහල්පතිතුමාගේ නිල කාමරය නවීකරණය කරදීමට අප සංගමයට හැකිවිය.

මෙම ව්‍යාපෘතිය ආදි ශිෂ්‍ය සංගමයේ 2001 කණ්ඩායම මගින් සිදුකරනු ලැබූ අතර, ගරු සමලේකම් අමිල නාවලගේ සහ ගරු උප සභාපති මධුසංඛ නාමසේන යන මහත්වරුන් එහි මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි. ඔවුන්ට සංගමයේ විශේෂ ස්තුතිය මෙහිලා පුදකර සිටිමු.

## 9. පාසලේ ශිෂ්‍යභට බණ්ඩයේ අභිවෘද්ධිය

දිස්ත්‍රික් අනුශුරතාවය ලබා ගනිමින් පළාත් තරඟ සඳහා සහභාගී වීමට පාසල් ශිෂ්‍ය භට බණ්ඩයට අවශ්‍ය කටයුතු සඳහා රුපියල් ලක්‍ෂය (රු. 100,000/-) ක මුල්‍ය පරිත්‍යාගයක් ලබා දෙන ලදි.

## 10. මේස පුටු අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරය

උප විද්‍යාලයේ කැඩී බිඳී ගිය මේස හා පුටු අළුත්වැඩියා කර පාසල් සිසුන්ට ලබා දීමේ ව්‍යාපෘතිය මෙවර ද 2022 ජනවාරි 17 වන දින උපසභාපති කුමාරසිරි බෝදරගම, උප සභාපති චමත් ඩයස් සහ නිලුක ඉරෝෂන යන මහත්වරුන්ගේ මූලිකත්වයෙන් ආදී ශිෂ්‍ය සංගමයේ සමාජිකයන්ගේ කාලය හා ශ්‍රමය වැය කරමින් සිදු කරන ලදි. මෙවර ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්‍ෂ දෙකකට ආසන්න වටනාකමකින් යුත් මේස 52 සහ පුටු 63 ක් නවීකරණය කොට පාසලට ලබා දුන් අතර, මෙම ව්‍යාපෘතියට ශ්‍රමය සහ ධනය වැයකල ගරු භාණ්ඩාගාරික දිනේෂ් කැටපෙආරච්චි, ගරු සමලේකම් ධනුක කොට්ටච්චි, උප සභාපති

සුමේධ පෙරේරා, උප සභාපති දිලීක විජේසිංහ, උප සභාපති නුවන් රණමයුරු, සමාජ කටයුතු ලේකම් චන්න ධම්මික, පළාත් සභා මන්ත්‍රී නීල් සුනේත්‍රලාල්, නාගරික මන්ත්‍රී සුරේෂ් ප්‍රනාන්දු, ධනුෂ්ක ප්‍රනාන්දු, ජනක චිත්‍රානන්ද, දිනේෂ් අබේපාල, අරුණ පෙරේරා, කසුන් හිරන්ත, නිශාන්ත සෙනෙවිරත්න, පසන් මධුක, නදුන් දර්ශන යන මහත්වරුන්ට අප සංගමයේ ස්තූතිය පිරි නමමු.

## 11. වෙනත්

- පාසලේ විදුලි පද්ධතිය නවීකරණය කිරීම සඳහා සංගමය ආධාර ලබාදීම සිදුකරන ලදි.

- පාසලට අවශ්‍ය ෆැක්ස් යන්ත්‍රයක් ගරු උප සභාපති දිලීක මධුරංග මහතාගේ අනුග ්‍රහයෙන් සංගමය විසින් පරිත්‍යාග කරන ලදි.

- පිහිනුම් තරගවලින් පාසලට අත්කර දුන් ජයග්‍රහණ හේතුවෙන් එහි පුහුණුකරුට දිරි දීමනාවක් ලෙස රුපියල් පහළොස් දහස (රු. 15,000/=) ක මුදල් සංගමය විසින් පරිත්‍යාග කරන ලදි.

- බටහිර තූර්යය වාදක කණ්ඩායමේ අවශ්‍යතා වෙනුවෙන් රුපියල් තිස්නවදහස් තුන්සිය හෑත්තෑ පහ (රු 39,375/-) ක මුදලක් වැයකරන ලදි.

- ආදි ශිෂ්‍යයින් ඉලක්ක කරගෙන Car Badge නිර්මාණය කිරීම සිදුකිරීම.

**<u>යෝජිත ව්‍යවස්ථා සංශෝධනය</u>**

ශ්‍රි සුමංගල විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමයේ ව්‍යවස්ථාවේ 5 අ III අනු ව්‍යවස්ථාවට පසුව පහත සඳහන් අතුරු විධානය ඇතුළත් කිරීමෙන් එකී ව්‍යවස්ථාව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

“මීට ඉහතින් කුමක් සඳහන් වුවද තෝරා පත්කර ගනු ලබන දිනයට පූර්වයෙන් පැවති ආසන්නම මහා සභා රැස්වීම් දෙකේදී ම අඛණ්ඩව සංගමයේ ගරු උපදේශකවරයෙකු ලෙස නම් යෝජනා වී ස්ථිර වූ අයෙකුට සභාපති ධූරයට තේරීපත් වීමට හිමිකම් ඇත්තේ ය.”

කෙසේ වුවද මෙම ව්‍යවස්ථා සංශෝධනය එය බල පැවැත්වෙන 2022-06-25 වන දින සිට එම මහා සභා රැස්වීම ද ඇතුළුව එදින සිට ඉදිරි මහා සභා රැස්වීම් දෙකක් සඳහා පමණක් බල පවත්වන අතර, ඉන්පසුව ස්වයංක්‍රියවම අහෝසි වී යන්නේ ය .

මෙම යෝජිත ව්‍යවස්ථා සංශෝධනය 2022-05-22 දින පැවති සංගමයේ විධායක සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>රාත්‍රී සුහද හමුව</u>**

රාත්‍රී සුහද හමුව 2022-06-25 වන දින ප.ව 7.00 ට පානදුර නල්ලුරුව JIE JIE Beach හෝටලයේ දී පැවැත්වේ. ප්‍රවේශ පත්‍රයක වටිනාකම රුපියල් 4000/- කි. ප්‍රවේශ පත්‍ර මිලදී ගැනීම සඳහා ගරු භාණ්ඩාගාරික දිනේෂ් කැටිපෙආරච්චි (0777316183 / 0716825697) මහතා සම්බන්ධ කර ගන්නා මෙන් දැනුම් දී සිටි.

**විශේෂ ස්තූතිය**

පසුගිය මාස හයක කාල සීමාව සාර්ථක කරගැනීමට අපට සහය වූ සියලු දෙනාටම අපගේ ගෞරවණීය ස්තූතිය මෙහිලා පුදකර සිටිමු. ඔවුන්ගේ සහයෝගය නොවන්නට ගෙවී ගිය කාලය සාර්ථක කරගැනීමට අප හට නොහැකි වනු ඇත. 2021/2022 නිල කාලයේ සාර්ථකත්වය උදෙසා සහය දුන් සැමට ස්තූතිය පුද කරමින් 2022 ජූනි මස 25 වන දින අභිනවයෙන් තේරී පත්වන නිලධාරී මණ්ඩලයට ආදි ශිෂ්‍ය සංගමයේ සහ පාසලේ දියුණුව උදෙසා ක්‍රියා කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමු.

ස්තූතියි.

නීතිඥ අමිල නාවලගේ මහතා
(සම ලේකම්)

ධනුක කොට්ටහච්චි මහතා
(සම ලේකම්)

# විශේෂ දැනුම් දීමයි

ඉදිරියේ දී ඔබගේ පුතා විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමට බලාපොරොත්තුවෙන් සිටිනම් අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම සඳහා පාසල හෝ සංගමය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳ හා දායක වීම වැදගත් වේ.

පළමු වසර සඳහා ආදි ශිෂ්‍ය පදනම මත සිසුන් ඇතුලත් කරගැනීම අධ්‍යාපන අමාත්‍යංශයේ විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනය ප්‍රකාරව පමණක් ම සිදුකරන බැවින්, අදාළ ලකුණු සම්පූර්ණ කරගැනීම සඳහා ඔබ විසින් එම උපදෙස් මාලාව පුද්ගලිකවම කියවා බලා දැනගෙන තිබීම වැදගත් වනු ඇත.

අදාළ උපදෙස් මාලාවේ පාසලේ දියුණුව වෙනුවෙන් සිදුකළ මෙහෙවර වෙනුවෙන් ලකුණු 6ක් වෙන්කර ඇති අතර, එය සම්පූර්ණ කරගැනීමට පාසල සහ/හෝ ආදි ශිෂ්‍ය සංගමය සමඟ අත්වැල් බැඳගෙන කටයුතු කිරීම වැදගත් වනු ඇත.

ඒ සඳහා පහත කොටස පුරවා සම ලේකම්, ආදි ශිෂ්‍ය සංගම් මූලස්ථානය, ශ්‍රී සුමංගල විද්‍යාලය, පානදුර යන ලිපිනය වෙත ලැබීමට සලස්වන්න.

ආදි ශිෂ්‍යයාගේ සම්පූර්ණ නම :

ආදි ශිෂ්‍යයාගේ ලිපිනය :

ආදි ශිෂ්‍යයාගේ සාමාජික අංකය :

දරුවා ඇතුලත් කිරීමට අපේක්ෂිත වර්ෂය :

දරුවාගේ නම :

දුරකථන අංකය :

සිරි සුමංගුල් විදුහලේ

යසස පතමු දින දිනේ

සුචරිත ගුණ දම් සොයා

සිසුනට දී දම් අමා

සුසිර පැතිර සුදිලෙවා

සුදිලෙවා සුදිලෙවා

සුසිර පැතිර සුදිලෙවා

හෙළ බස හෙළ ගී අපේ

ජාතික සුසිරිත් කලා

දෙවමින නිති වැඩ සැදූ

සුමංගුල් මව වැජඹෙවා

වැජඹෙවා වැජඹෙවා

සුමංගුල් මව වැජඹෙවා